# අනුරාධපුර ශුද්ධ නගරයේ මහා විහාරය

ඉඤැවංශ මහා ස්ථවිර

'ස්ථවිර වාද' නම් වූ සාර්ථකථා ත්‍රිපිටක පාළි ධර්මීය හා බෞද්ධ ආචාර ධර්ම පද්ධතිය අවිනෂ්ට ව, ආරක්ෂා වූ ශ්‍රේෂ්ඨ තම බල කොටුව වූ ද, අග්නිදිග ආසියාතික රටවල අද පැතිර පවත්නා ථෙරවාද බුදු දහමේ කේන්ද්‍රස්ථානවලින් එකක් වූ ද, සිංහල බෞද්ධ සංස්කෘතියේ ප්‍රභවස්ථානය වූ ද අනුරාධපුර මහාවිහාරය අද නටබුන් රැසක් හැටියට පැවැතුණත් එයට ඇත්තේ, එක් දහස් පන්සිය වසරක් පමණ දීර්ඝ වූ අඛණ්ඩ පුරාවෘත්තයෙකි. මෙතරම් පැරණි ඉතිහාසයකට හිමිකම් කිව හැකි අන් කිසිදු බෞද්ධ ආයතනයෙක් ලොව නැත් මැ යි. දසවන සියවසේ අග භාගයේ දී පමණ අප රටට එල්ලවුණු චෝළ ආක්‍රමණයත් එක්කම අනුරාධපුර රාජධානිය හා මහා විහාරය ඇතුළු සංඝාරාම වැනසී ගිය නමුදු, මේ මහා විහාරය යළි පණ ගැන්වී දෙළොස් වන සියවස දක්වා භික්ෂූන් වහන්සේලා ගෙන් නො සිස් ව පැවැතිණි.

තෙළෙස් වන සියවසේ ආරම්භයත් සමඟ මැ වාගේ කාලිඞ්ග මාඝයන් ගෙන් පොළොන්නරුව ඇතුළු එ මුළු රජ රටට මැ වැදුණු මරුපහරින් මහාවිහාරය යළි නො නැඟිටින සේ ඇද වැටුණේය. අනතුරු ව පරසතුරන් ගේ හා මිසදිටුවන්ගේ අමානුෂික පහරටත්, නිදන් හොරුන්ගේ හා සොබා දහම් ඩාකිනියගේ තියුණු අතවරයටත් ගොදුරු වෙමින් ඝනවනරොදින් වැසී ගොස් බිහිසුණු වන මෘගයන්ගේ රජ දහනක් ව පැවැතෙමින් සියවස සයකටත් වැඩි තරම් කාලයක් මුළුල්ලෙහි අඳුරේ ගැලී තිබුණු මහාවිහාරය නැවත එළි පෙහෙළි වීමට පටන්ගත්තේ මහසෑ රදුන්ගේ නව පිළිසකර වැඩ ඇරැඹීමත් සමඟ මැ යි. පහන් සංවේගජනක අතීතශ්‍රීවිභූතිය ගොළු බසින් ලොවට කියාපාන අමූල්‍ය පූජ්‍ය වස්තුවලින් පිරීගිය පුරාවිද්‍යා කෞතුකාගාරයක් බඳු මහාවිහාරයේ ආරම්භ අවස්ථාව හා එහි සමුන්නතිය පිළිබඳ අංශුමාත්‍ර සඳහනක් වශයෙන් මේ ලිපිය සපයම්හ.

**මහා විහාරයේ ආරම්භය.**

දේවානම්පියතිස්ස (ක්‍රි. පූ. 250 - 210) මහරජතුමා විසින් ''මහා මේඝවන'' නම් රාජකීය උද්‍යානය අනුබුදු මිහිඳු මාහිමියන් ප්‍රමුඛ මහාසංඝරත්නයට සඟසතු කොට පූජාකිරීමෙන් පසු හෙළදිව පළමු සංඝාරාමය වූ මහාවිහාරයේ ආරම්භය ඇතිවිය. මේ සංඝාරාමභූමිය සඟනට පූජාකරද්දී මහ පොළොව කම්පාවිණැයි කියති. මුල් වකවානුවේදී මහා මේඝවනාරාම හා තිස්සාරාම කියා හැඳින්වුණු මේ ආරාමය පසු කාලයේදී පළටවූයේ හුදු 'මහා විහාර' නාමයෙන් මැ යි. අනුරාධපුරයට සැපත් වූ දෙවන දිනයෙහි මහ මෙවුනාව පිළිගත් මිහිඳු මාහිමියන් කළ මුල් මැ ක්‍රියාව නම්; අනාගත කාලයෙහි මහා ආයතනයකට

යෝග්‍යවන පරිදි පූජනීය ස්ථාන සහ ආරාමාංගයන් එහි පිහිටුවීමට සුදුසු ස්ථානයන් රජහට පෙන්වාදීමයි. භූමිභාග වින්‍යාස කිරීමෙහිදී මාධ්‍යය කොටැ සැල කුයේ එහි පිහිටි රාජනිවේසනය යි

රජුත් සමග උයනේ ගමන් ගත් මා හිමියෝ උත්තමස්ථාන සතක් රජුට හඳුන්වා දුන්හ. එනම්;

1. රජගෙට දකුණේ පුළිල වෘක්ෂය පිහිටි සංඝකම් මාලකස්ථානය,
2. රජගෙට උතුරේ ජන්තාඝර පොකුණ පිහිටන ස්ථානය,
3. රජගෙයි නැගෙනහිරි දෙරටුව සමීප යෙහි වූ බෝධිරාජයා පිහිටුවන ස්ථානය,
4. මහාසංඝයාගේ උපෝසථාගාරය වූ ලෝවාමාපාය පිහිටුවනු ලබන මහා මුචල මාලකස්ථානය,
5. 'පැනඹ මළුව' නම් වූ සන්නිපාත ශාලාව පිහිටුවන ස්ථානය,
6. 'චතුශ්ශාලා' නම් වූ මහබොජුන්හල පිහිටන ස්ථානය,
7. මහාචෛත්‍යරාජයා පිහිටුවන ස්ථානය යනුයි.

මිහිඳු මාහිමියන් රජුත් සමග මෙකී සප්ත ස්ථානයට ගොස් මල් පිදීමත් සමඟ මැ මහපොළොව කම්පාවූ බවක් මහාවංශ වාර්තාවෙන් පෙනේ.

''අකම්පො කම්පයිත්වා මහිං ඨානෙසු අට්ඨසු'' කියා 'අට තැනෙකදී මහපොළොව කම්පාවිණැ'යි වංශ කථායෙහි එන්නේ, පූර්වොක්ත සප්ත ස්ථානයේදී හා මුළින් මැ මහ මෙවුනා උයන පිළිගත් අවස්ථාවේදීත් සිදුවූ පොළෝකම්පාවීම් ගැන සැලකීමෙනි. කිසිදු වෙනසක් නොමැති වැ මේ සප්ත ස්ථානය මැ දසවන ශතවර්ෂයේ දී රචිත පාළි මහබෝධිවංසයෙහිදු[1] එයි.

පූජාවලියෙහි; ''මෙසේ සප්ත ස්ථානය ම උත්තම ස්ථානය යි, බුදුන් රහතුන්ගේ පාරිභෝගික භූමියයි ස්තුති කොට'' යනු වෙන් සටහන් කොටැ ඇත්තේ ද යථෝක්ත සප්තස්ථානය මැයි.

මේ මෙසේ වුවද; සද්ධර්මාලංකාරයෙහි;

''1. රජගෙට දකුණු දිග මාලක සීමාවය, 2. උතුරුදිග ජන්තාඝර නම් පොකුණය, 3. නැගෙනහිර වහසල් දෙර මහා බෝධි ස්ථානය, 4. ලෝවාමහා ප්‍රාසාදස්ථානය, 5. ලහබත් ගෙය, 6. චතුශ්ශාලාව පිහිටන තැනය, 7. මහා භෝජන ශාලාවය, 8. රත්නමාලි චෛත්‍යස්ථානය යන මේ අට-මස්ථානයෙහි මල් පුද අටවරෙක මහ පොළොව ගුගුරුවා''[3] කියා මහමෙවුනාවේ අටමහ තැනක් ගැන දක්වා ඇති බව පෙනේ. සප්තස්ථානයක් මිස අෂ්ට ස්ථානයක් එහි නො ලැබිය හැකි ය. මෙහි අට තැන සපුරාලනු වස් 'බොජුන් හල' යන අරුත්හි ඉතා ප්‍රකට 'චතුස්සාලා' ශබ්දය 'චතුශ්ශාලා' කියා වරකුත්, 'මහා භෝජන ශාලා' කියා තවත් වරකුත් යොද ඇති සැටි පෙනේ. මේ දෝෂය ග්‍රන්ථ කර්තෘ වූ දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති මා හිමියන් ගෙන් සිදුවූවකැයි කෙසේවත් නො පිළිගත හැකි ය. මෙය කිසියම් පොත් පිටපත් කරන්නකු අතින් පසු කලෙක සිදුවූවක් විය යුතු ය. සමහරවිට මේ දෝෂය අට තැනෙක පොළෝකම්පා වීම පිළිබඳ වංශ කථා පුවත සඳහනට ගත් පිටපත්කරුගේ අනවධානයෙන් යෙදු ණෙකැයි කිවහැකි ය.

මහමෙවුනා උයනේ අටමස්ථානය (අෂ්ට මහාස්ථානය) සම්පූර්ණ වීමට නම්; යථෝක්ත සප්ත ස්ථානයට 'තිස්සාරාම' යන්න ද එක්කර ගත යුතු ය.

තවද; මහමෙවුනාවේ මිහිඳු මාහිමියන් දක්වූ සප්තස්ථානයෙන් විනය අටුවාවේ[4] ඇත්තේ; ලෝවාමාපාය, පැනඹ මළුව හා මහ සෑ පිහිටුවන ස්ථානය යන තුන් තැන පමණෙකි. භූමිවින්‍යාසය උයන් පූජා කළ දිනයෙහි මැ සිදුවූවක් බව මහාවංශය

කියතත්, විනය අටුවාව කියන්නේ, මහා බෝධීන් වහන්සේ පිහිටුවීමටත් පසුව සිදුවූ ලෙසට ය. විනය අටුවාවෙහි ස්ථාන කිපයක් අඩුවීම ගැන ප්‍රශ්නයක් නැතත්, කාලය සම්බන්ධයෙන් මෙපරිදි ලොකු වෙනසක් ඇතිවූයේ මක්නිසාද?යි සිතාගත නො හැකි ය.

**සඬසකම්මාලකය**

රජගෙයට දකුණින් පිහිටියා සේ ඉහත දැක්වූ 'පුළිලමළුව' මහා බෝධියෙන් ගිනි කොන්හි පිහිටි මළුවකැ යි මහාබෝධිවංශ ග්‍රන්ථිපද විවරණය[5] කියයි. මහ බෝ වැඩමකර ගෙනැ පැමිණි රාජ කුමාරයනට තනතුරුදීම පිළිබඳ රැස්වීම් කැරුණේත් මේ පුළිලමළුවෙහි දී මැ යි. දැන් මෙය කොතන්හි පිහිටියේ දැ? යි සොයා ගත නොහේ.

මිහිඳු මාහිමියන් වැඩ සිටි කාල ප්‍රාසාදයේ දෙරටුවට නැගෙනහිරි දෙසින් පිහිටියා සේ අදහස් කරන 'ජන්තාඝර' පොකුණ මහා වංසටීකා කාලය වූ නව වන සියවස වන විටත් නටබුන් වැ තිබුණු සැටි තත් ග්‍රන්ථයෙන් මැ[6] ඔප්පු වෙයි. මේ 'ජන්තාඝර' පොකුණ ගිනිහල් පොකුණ හැටියට සලකන මහාබෝධිවංශග්‍රන්ථිපද කර්තෘවරයා එය තිබුණු ස්ථානය පස්වලින් ගොඩ කොටැ පසු කාලයෙහි පිරිවෙනක් කළ බවත්, ඒ සමීපයෙහි 'හෙළිගල් පොකුණයැ'යි ප්‍රසිඬ පොකුණක් පවත්නා බවත් කියා ඇත.[7] මහාබෝධිවංශග්‍රන්ථිපදය 12 වන සියවසේදී ලියැවුණු ග්‍රන්ථයෙකැයි පිළිගෙන ඇති හෙයින් ඒ කියන හෙළිගල් පොකුණ ශුද්ධ නගරප්‍රදේශයේ කෞතුකාගාරයට නැගෙන හිරින් දනට දක්නට ලැබෙන සුදුගල් පොකුණ දැ? යි විමසාබැලිය යුතු ය. දර්ශනීය ලෙස සුදුගලින් නිර්මාණය කොටැ ඇති මේ පොකුණ උණුවතුර නෑමට ද පහසු-වන සේ පිළියෙළ කොටැ ඇති සැටි පෙනියයි. ඒ පොකුණට දකුණු පැත්තේ, නුදුරුවැමැ ගරා වැටුණු තවත් පොකුණක් පවත්නා බවත් කිව යුතු ය.

මහවිදෙල්මළුවේ දුටුගැමුණුඅබා නිරිඳුන් කැරැවූ ලෝවාමාපාය ඉතා ප්‍රකටවූවකි.

**පැනඹමළුව**

සඞසයාට ලැබෙන ලාභ බෙදා ගන්නා සථානය හැටියට මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් පැනඹමළුව විශේෂ වැදගත් කමක් ඇති ඓතිහාසික සථානයෙකි. නම් කීප-යෙකින් මැ මේ ස්ථානය අටුවා කථාවල ද නොයෙක්විට දැක්වේ. වංශ කථාවල මෙය දැක්වෙන්නේ, 'පඤ්හම්බ මාලකට්ඨාන' කියා ය. මේ ස්ථානයේදී රජු පිළිගැන් වූ මිහිරි අඹ ගෙඩියක් වැළඳූ මා හිමියන් ඒ අඹ ඇටය රජු ලවා රෝපණය කැරැ වූ බවත්, ඒ මොහොතේදී මැ උන්වහන්සේගේ සෘද්ධ්‍යනුභාවයෙන් අඹ ඇටය පැළ වී, අඹ ගසක් පැන නැඟී, මලින් හා ඵලයෙන් පිරීගිය බවත් වංශකථාව කිය යි[8] මේ අඹගස නිසා මුල් කාලයේ දී ඒ ස්ථානය හැඳින්වුණේ 'අඹමළුව' (අම්බඞගණ) යනු වෙනි. විනය අටුවාවෙහි[9] හා දික්සඟි අටුවාවෙහි[10] 'අම්බඞගණ' කියා ඇත්තේ එහි පාළිරූපයයි.

පසු කාලයෙහි දී මේ ස්ථානයෙහි දී ප්‍රශ්න ඇසීම් හා විසඳීම් කෙරුණු හෙයින් 'පැනඹමළුව' යැ යි බැවහර වන්නට ඇත. 'පඤ්හම්බමාලකට්ඨාන'[11] 'පෙන්නම්බඞ-ගණ[12]යිදෙවිදියෙකින් වංශකථාවල හා අටුවා වල ඇත්තේ මෙහි පාළි පරිවර්තනය යි.

සහස්සවත්ථුප්පකරණයෙහි[13] රුහුණේ තිස්සමහාරාමයේ තිබුණු 'පඤ්චම්බමාලක' නම් ස්ථානයක් ගැන සඳහන් වෙයි. මේ කියන 'පඤ්චම්බමාලක' යන්නේ 'පඤ්ච' යනුව 'පඤ්හ' යන්න වෙනුවට ලේඛක දෝෂයක් හැටියට වැටුණක් නම් තිස්ස මහාරාමයේත් පෙරැදවස පැනඹමළුවක් තිබිණැ යි පිළිගැනීමට ඉඩ තිබේ. ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා විශ්වවිද්‍යාල-යීය ලංකාඉතිහාසයේදී මහාවංශයේ එන 'පඤ්හම්බ' යනුවට ''ප්‍රශ්න විසඳන අඹ ගසක්[14] යන අමුතු අරුතක් දී ඇති බව ද මෙහිලා සඳහන් කටයුතුය.

පැනඹමළුවෙහි මණ්ඩපයක් සැදීමෙන් පසු එය 'පඤ්හමණ්ඩපට්ඨාන'[15] හා මහා මණ්ඩප'[16] කියා වහරවන්නට ඇති බවට සාක්‍ෂ්‍ය ලැබේ. මේ පැනඹමළුවෙහිදී ධර්‍ම සංවාද හා ධර්‍මදේශනා පමණක් නොව චීවරාදී පරිෂ්කාර හා ගිතෙල් – උක්සකුරු ආදි බෙහෙත් ද්‍රව්‍ය බෙදදීමත් සිදු වූ සැටි ප්‍රකට ය. සද්ධාතිස්ස රජතුමා ආදි පැරැණි රජදරුවෝ මහ සඟනට බෙදදීම සඳහා ගිතෙල්-උක් සකුරු ආදිගිලාන ප්‍රත්‍යයවර්ග මේ ස්ථානයට යැවූහ. සංයුත් සඟි අටුවාවේ සැදෑතිස් මහ රජුගේ උක්සකුරු දනයක් පිළිබඳ පුවතක් එයි.[17] කිසියම් වරදක් නිසා සිය සොහොවුරු වූ වෝහාරතිස්ස රජුට බියෙන් දඹදිවට පළාගිය අභයනාග රජු එහි දී තෙර නමකගෙන් ලැබුණු ආගන්තුක සත්කාරයට පැහැදී මෙරටට අවුත් රජයට පැමිණැ, දිවි තාක් පැවැත් වූ 'මහාභේසජ්ජදාන'ය සිදු කරන ලද්දේ ද පැනඹමළුවේදී යැයි අත්ථසාලිනිය කියයි.[18] ඒ රජු ලෝවාමාපාමළුවේ කැරැවූ සේ මහාවංශය කියන[19] මණ්ඩපය බෙහෙත් දනය දීමට පැනඹමළුවෙහි කරන ලද්දක් විය යුතු ය.

## පැනඹමළුව රාසිමාලකයද?

පසු කාලයේ දී මේ පැනඹමළුව 'පැන මඩුව' (පඤ්හ මණ්ඩප) 'මහ මඩුව' (මහා මණ්ඩප) යන නම්වලින් පමණක් නොව 'පිරිත් ලහගේ', 'ලහබත් ගෙය' යන නම් වලිනුත් ප්‍රකට වූ අයුරු පෙනේ. 'පිරිත් ලහගේ' යනුව මහා බෝධිවංශ ග්‍රන්ථි පදයෙහිත්,[20] 'ලහබත්ගෙය' යනුව සද්ධර්මාලංකාරයෙහි හා සද්ධර්මරත්නාකරයෙහිත්[21] දක්නට ඇත. පිඬු පිණිස වඩින භික්ෂූන්වහන්සේලා ප්‍රථමයෙන් මෙ තැනට පැමිණැ මෙත්තසූත්‍රය සජ්ඣායනය කොටැ තමන් යායුතු තැන්වල නම් ලියූ සලාක පත් රැගෙනැ ගමන් කිරීම අඛණ්ඩ චාරිත්‍රයක් වශයෙන් පැවැත් වූසේක. සලාකයට අනුව ලැබෙන දනය සලාකබත හැටියට සැලකිණි. පිරිත් බැණ ගෙනැ, සලාක ලබාගත් ස්ථානය හෙයින් උපචාර වශයෙන් මෙ තැනට 'පිරිත් ලහගේ' කියා බැවහර විය.

සද්ධර්මාලඞ්කාරයෙහි දැක්වෙන "පැනඹමළුව ය යි ව්‍යවහාරලද රංසිමාලක නම් වූ ලහබත් ගෙය පිහිටි තැන"[22] යන ප්‍රකාශය නිසා පැනඹමළුවත්, රාසිමාලකයත් එකක් හැටියට සමහරුන් සලකතත්, ඒ මතය තහවුරු කෙරෙන සාධකයක් අන්‍යග්‍රන්ථයෙකින් නො ලැබෙන බව හැඟේ. සාමාන්‍යයෙන් සඞ්ඝයා රැස්වන මළුවට රාසිමාලකයැයි කිය හැකිවුව ද, එ නමින් විශේෂ ස්ථානයක් පැවැති හෙයින් පැනඹමළුවට රාසිමාලකයැ යි කීමෙ යුක්තියෙක් නො පැනේ. 'රංසිමාලක' යන වචනය පවා 'රාසිමාලක' යන්නෙන් ආ සාවද්‍ය ව්‍යවහාරයෙකැ යි සැලකියහැකි ය.

පැනඹමළුව පිහිටා තිබුණේ ලෝවාමාපායට බටහිරිනි. ශ්‍රීමහාබෝධියට උතුරෙනි. රුවන්වැලි මහසෑයේ නැඟෙනහිරි දොරටුවේ සිට බෝධිරාජයා වෙත වැටී ඇති මාවතේ දකුණතින් දක්නට ලැබෙන නටබුන් ගොඩනැඟිල්ල පැනඹමළුවේ එදා පිහිටා තිබුණු මණ්ඩපය සේ සැලකියහැකි ය. මෙය බිත්ති නො යෙදූ විවෘත මණ්ඩප විශේෂයකට අයත් වේ. දැනට ගල්කණු කීපයක් පමණක් දක්නට ඇති මේ ගොඩ නැඟිල්ල පෙරැ පේළියකට කණු දහයකින් යුත්, කණු පේළි අටකින් සැදුම්ලත් ගොඩ නැඟිල්ලක් බව හැඟේ. පදනම උඩ වටේට මැ ඇතුල් පැත්තට ඕවලාකාර හැඩයක් ගන්නා මට්ටම් කළ ලොකු ගල් යොදා ඇති අතර, ලී වැටෙකින් ද ආවරණය කොටැ තිබුණු ලකුණු පෙනේ. ගොඩ නැඟිල්ලට ඇතුළුවීමට දොරටු සතරෙක් ද විය.

මිහිඳු මාහිමියන් රජුට පෙන්වා දුන් 'චතුස්සාලා' නම් මහාභෝජනශාලාව රුවන්වැලි මහ සෑ රදුන්ට නැගෙනහිරින් පිහිටා තිබේ. පුරාවිද්‍යා අධිකාරිය මගින්

අඩි පහක් පමණ පොළොව කැණ මෙය මතු කරන ලද්දේ මෑතදී ය. මේ බොජුන් හල මුල දී කරවන ලද්දේ දෙවන පැතිස් රජු විසින් වුවත්, පසු කාලයේ දී නොයෙක් රජුන් විසින් නවහම් කරමින් සුරක්ෂිත කරන ලද බවට සැකයෙක් නැත.

## සිංහ වික්‍රීඩිත සැලසුම

මිහිඳු මා හිමියන් මහ මෙවුනාවේ ගොඩ නැඟිලි ඉදිකළ යුතු තැන් හඳුන්වා දෙන්නට ඇත්තේ යම්කිසි සැලසුමකට අනුකූලව යැ යි පිළිගත හැකි ය. උන් වහන්සේට වාස්තුවිද්‍යාව පිළිබඳ නිපුණත්වයක් තිබුණාට සැකයෙක් නැත. එහෙත්, ඒ ගොඩනැඟිලි පිහිටුවීම පිළිබඳ සැලැස්මක් ගැන වංශ කථායෙන් කිසිවක් දැනගත නො හැකි ය. එසේවුවත් පාළි මහාබොධිවංසයෙහි සිංහ වික්‍රාන්තියට අනුව ගොඩනැඟිලි සැලසුම් කළ සැටි දක්වෙයි.[23] සිංහ වික්‍රාන්ති නම්; සිංහ රාජයකු වාලධිය දිගු කොටැ ගෙනැ, අත්–පා නො සරිලෙස ඉදිරි වැ පිහිටුවා තබා, දක්ෂිණ පාර්ශවයෙන් ආපසු බලා සිටීමයැයි සද්ධර්මාලඞ්කාරයෙහි කිය වේ.[24] ආපසු බලා සිටිනුයේ, උතුරු දෙසට මුහුණ ලා සිටි සිංහයා බව ද කල්පනාවට ගතයුතුයි.

එපරිදි 1. සිංහයාගේ වාලධි කෙළවර වැදගත් තැන මහාබෝධිගෘහය, 2. දකුණු පය පිහිටි තැන ලෝවාමාපාය 3. වම්පය පිහිටි තැන පැනඹ මළුව (සන්නිපාත සාලාව), 4. නාභිස්ථානයෙහි ධාතුගෘහය, 5. වාමෝදර පාර්ශවයෙහි රාසිමාලකය, 6. දකුණු අත පිහිටි තැන භෝජන ශාලාව, 7. වම් අත පිහිටි තැන මහා චෛත්‍යය, 8. කණ්ඨස්ථානයෙහි (ග්‍රීවය පිහිට තැන) කණ්ඨක පුෂ්කරණිය, 9. කර පෙරළා දකුණැලයෙන් බලා සිටීයහුගේ දෘෂ්ටිය වැටුණු තැන ප්‍රතිමාගෘහය යනුවෙන් ආරාම ගොඩනැඟිලි පිහිටුවන ලද බව පෙනියයි. මෙ මැ ගොඩනැඟිලි සැලැසුම 'සිංහ වික්‍රාන්ති' බව සද්ධර්මාලඞ්කාරයෙන් පෙනේ.[25] සිංහලබෝධිවංශයෙහි 'සිංහ වික්‍රීඩිත' යැ යි කීයේත්[26] මෙ මැයි. මෙහි ස්ථාන නවයෙක් එයි. මේ සැලසුම දෙවන පැතිස් රජුගේ අදහසට එකඟ වැ සිංහලයාගේ සිංහ සංකේතය සිහිගන්වමින් කරුණු සේ හැඟේ. මෙයට මිහිඳු මාහිමියන් කලින් පෙන්වාදුන් පුළිලමළුවේ සඞ්ඝකර්මමාලක ස්ථානය හා ජන්තාඝර පොකුණ ඇතුළු නුවූ අතර, උන්වහන්සේ හඳුන්වා නුදුන් ධාතු ගෘහය, රාසිමාලකය, කණ්ඨක පොකුණ හා ප්‍රතිමා ගෘහය යන තැන් ඇතුළු කොටැ ඇත.

මේ ස්ථානවලින් රාසිමාලකය, ධාතු ගෘහය හා ප්‍රතිමා මන්දිරය යන තැන් දැනට සොයාගත නො හැකි වැ ඇති අතර කණ්ඨක පොකුණ නම් සොයා ගෙනැ ඇත්තේ ය. එය රුවන්වැලි පන්සලේ ඇති පොකුණයැ යි කියති. මේ පොකුණේ විෂ්කම්භය විශාල නුවුව ද බඹගණනක් ගැඹුරෙන් යුතුයැයි සලකති.

පැරණි පිළිමගෙය ලෝවාමාපායටත්, මහා භෝජන ශාලාවටත් අතරේ මහ බෝ මා වත ආසන්න වැ පිහිටා තිබුණේයැ යි අනුමාන කළ හැක්ක. දැනට ඒ හරියේ නිදන්කොටු පස්විස්සකින් යුත් යන්ත්‍ර ගලක් දක්නට ලැබේ. මෙබඳු ගර්භගල් පිළිම සෑදීමේදී එයට යටින් පොළොවේ තැන්පත් කිරීම පැරණියන් අතර පැවැති සිරිතෙකැ යි ආචාර්‍ය පරණවිතාන මහතා අදහස් කළ බව ප්‍රකට ය. මේ සථානයේ පොළොව කැණ පරීක්ෂා කළ හොත්, එහි නටබුන් මතු කැරලීමට පිළිවන්වනු නිසැක ය. කෙසේවුව ද පිළිම සෑදීමත්, ප්‍රතිමා මන්දිර ගොඩනැංවීමත් ක්‍රි. ව. 1 සියවස් කාලයෙන් මොබ සිට ඇරැඹුමක් මිස එයට පූර්වකාලීනයැයි නොසැලකෙයි.

## පතන් භූමියෙහි රුවන්පාය

මහ මෙවුනා උයන්හි බුදුරජාණන් වහන්සේ සහිත මහා ශ්‍රාවකයන් වහන්සේලා වැඩ සිටි ස්ථානයක් හැටියට සද්ධර්මාලඞ්–කාරයෙහි හා සද්ධර්ම රත්නාකරයෙහි[27] සඳහන් වන 'පතන් භූමියෙහි රුවන්පාය' පිහිටි ස්ථානය කුමක් ද? යි සොයා බලනුත් සුදුසු ය. ඒ පොත්වල මහ මිදෙල්මළුවේ ලෝවාමාපාය ගැන වෙන ම සඳහන් වන හෙයින් මේ කියන රුවන්පාය අමුතු ස්ථානයෙකි. මේ කියන්නේ, ලීලාවතී රැජිනගේ අග්‍රාමාත්‍ය වූ කීර්ති සෙනෙවියා

(ක්‍රි. ව. (1197-1200) පතන් භූමියෙහි කැරවූ රුවන්පාය ගැන විය යුතුයි. පතන් භූමි නම්; රුවන්වැලි මහසෑයට දකුණෙන් පිහිටි භූමි ප්‍රදේශය යි.

බයා බැව් ඉවුරේ ගල්ටැඹෙක කොටා ඇති, කිත් සෙනෙවියා පිහිටුවා ඇති සෙල් ලිපියේ රුවන්පාය ගැන සඳහන් වන්නේ මෙසේ ය; ''ශ්‍රීමත් ඔකාවස් රජ පරපුරෙන් ආ අභාසලමෙවන් ලීලාවති ස්වාමින්ගේ අග්‍රාමාත්‍යවූ ලක් විජය සිඟු කිත් සෙනෙවියන් තුන් වන්නේ අනුරාධපුරයෙ පතන්භූමියෙ තමන් කැර වූ රුවන් පායෙහි වැඩහුන් සඟුරුවන්ට'' යනුයි. ලිපියෙන් කියා ඇත්තේ, තමන් කැරවූ රුවන්පායට හා ප්‍රතිමා මන්දිරයටත්, රුවන්වැලි මහසෑ රදුන්ටත් කුඹුරු ප්‍රමාණයක් පූජා කරන ලද අයුරුයි. ඒ ලිපිය දනට ඇත්තේ කොළඹ කෞතුකාගාරයේය. පශ්චාත් කාලීන සමහර ග්‍රන්ථ කර්තෘවරයන් මහමෙවුනා උයනේ පූජ්‍යස්ථාන පිළිබඳ යම්-යම් සාවද්‍ය අදහස් ඉදිරිපත් කොටැ ඇති බව ද මෙහි ලා සඳහන් කටයුතුය.

**මහාවිහාරයේ උන්නතිය හා අවනතිය**

දුටුගැමුණු, සද්ධාතිස්ස ආදී රජවරුන්ගේ කාලවල දී මහාවිහාරය නොයෙක් ආගමික ගොඩනැඟිලිවලින් අලඞ්කාර විය. ii භාතිය (ක්‍රි. ව. 143-167) රජු විසින් මහාවිහාර සඞ්ඝාරාමය වටා පවුරක් බඳවා, දෙරටු සතරක් යොදා අතිශය ශෝභාසම්පන්න කරන ලදී. අනුරාධපුර යුගයේ මුල් සියවස් කීපය තුළදී සිය ගණන් සුවිසල් ගොඩනැඟිලි වලිනුත්, දහස් ගණන් සිලවත් - උගත් භික්ෂූන් වහන්සේලාගෙනුත් මහා විහාරය උත්කර්ෂවත් ලෙස බැබළුණේය. මහසෙන් (ක්‍රි. ව. 274-301) රජුගේ විනාශකාරී - මර්දන ව්‍යාපාරවලින් මහාවිහාරයට වැදුණේ මරුපහරෙකි. එතෙක් කල් සශ්‍රීක වැ වැඩුණු මහ වෙහෙර මේ නිසා පාළු වී, නිශ්‍රීක බවට පත්විණි. පසුව මහසෙන් ගේ පුත්‍ර සිරිමෙවන් (ක්‍රි. ව. 301-328) එය යථාතත්ත්වයට පත්කරන්නට යත්න දැරූ නමුදු සාකල්‍යයෙන් ඒ උත්සාහය පරිපූර්ණ නො විණි. එසේවුවත්, මහාවිහාරය නොයෙක් රජුන්ගේ සදුත්සාහයෙන් දිගටමැ ආරක්ෂා වුණේය. මේ අති පූජනීය මහා-විහාරය සම්බන්ධයෙන් කියයුතු දෑ බොහෝවතුදු මේ එයට නො තැනි. ථූපාරාමවිහාරසීමාවේ සිට දකුණු වෙහෙර තෙක් දිගින් හා ජේතවන (බයා ගිරි) හන්දියේ සිට බසවක් කුලම් වැ කණ්ඩිය තෙක් ද, ශ්‍රී මහා බෝධිරාජයාට නැගෙන හිරින් පිහිටි හින්දු කෝවිල ආසන්න හන්දියේ සිට සුන්භාත විශ්‍රාම ශාලාව තෙක් ද පුළුලින් යුත් මහාවිහාර භූමිය ආයත චතුරශ්‍ර හැඩයෙන් යුක්තය.

මහාවිහාර හා ජේතවන යන විහාර දෙක වෙන් වී ඇත්තේ හාල්පානු ඇලෙනි. බුජ්ජ තිස්ස වෙහෙර හා බුද්ධශ්‍රාවකධම්පියය පිහිටා ඇත්තේද හාල්පානු ඇලේ බස්නාහිර තීරයේ ය. රහත් උතුමන්ට හා කල්‍යාණ පෘථග්ජන සුසිල්වත් ධර්මධර - විනය ධර යතිවරයන් වහන්සේලාට නිවාසභූමි වූ මහාවිහාරය අද පවත්නේ නටබුන් රැසක් ලෙස ය.

1. මහාබෝධිවංශ 79-80 පිටු
2. පූජාවලී (අමරමෝලි) 766 පිට
3. සද්ධර්මාලංකාර (රත්නාකර) 350 පිට
4. විනයට්ඨකථා 1-59 පිට
5. මහාබෝධිවංශ ග්‍රන්ථිපද 130 පිට
6. මහාවංසටීකා 241 පිට
7. මහා බෝධිවංශ ග්‍රන්ථිපද 130 පිට
8. මහාවංස 15-42,43
9. විනයට්ඨකථා 59, 654 පිටු
10. දීඝනිකායකට්ඨ කථා 740 පිට
11. මහාවංස 15-38
12. අත්ථසාලිනී 382 පිට
13. සහස්සවත්ථුප්පකරණ 87 පිට
14. විශ්ව විද්‍යාලයීය ලංකා ඉතිහාසය 1. 133 පිට
15. සංයුත්ත නිකායට්ඨකථා iii. 151 පිට.
16. මජ්ඣිම නිකායට්ඨ කථා iv 219 පිට
17. සංයුත්ත නිකායට්ඨ කථා iii. 48 පිට
18. අත්ථසාලිනී 332 පිට
19. මහාවංස 36-52
20. මහාබෝධිවංශ ග්‍රන්ථිපද 135 පිට
21. සද්ධර්මරත්නාකර 358 පිට
22. සද්ධර්මාලඞ්කාර 391 පිට
23. මහාබොධිවංස 86 පිට
24. සද්ධර්මාලඞ්කාර 394 පිට
25. සද්ධර්මාලඞ්කාර 394 පිට
26. සිංහල බෝධිවංශ විල්ගම්මුල පබඳ 469 පිට
27. සද්ධර්මාලඞ්කාර 394, සද්ධර්මරත්නාකර 358 පිටු.

# අනුරාධපුර මහා විහාරයේ සැලැස්ම

(දළ සටහනකි)

